අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2025(2026)

පෙරහුරු විභාගය

General Certificate of Education
(Ord. Level) – 2025 (2026)
Practice Test



තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

Information and Communication Technology

Past Papers Wiki

සියළු ම හිමිකම් ඇවිරිණි [All rights Reserved]

Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta
ජානක පුෂ්පකුමාර ප්‍රශ්න පත්‍ර සේවාව
Janaka Pushpakumara Paper Service
Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta
Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta

80	S	I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2025(2026) පෙරහුරු විභාගය
General Certificate of Education (Ord. Level) – 2025 (2026) Practice Test

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	**I, II**
Information and Communication Technology	**I, II**

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි**
Additional Reading Time - 10 Minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

M-01 **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I**

උපදෙස්:

* **සියළුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ **(×)** ලකුණ යොදන්න.
* වැඩිදුර උපදෙස් බහුවරණ පිළිතුරු පත්‍රයේ පිටුපස දක්වා ඇත.

---

01. පහත සඳහන් උපයෝගීතා මෘදුකාංග පිළිබඳ ප්‍රකාශයන්ගෙන්, මෘදුකාංගයේ **නම** සහ එහි විස්තර කරන ලද කාර්යය අතර **ගැළපීමක් නොමැති** ප්‍රකාශය කුමක්ද?

1) *දත්ත උපස්ථ කිරීම (data backup)* – දත්ත නැවත ලබා ගැනීමට (data recovery) හැකි වන පරිදි, දත්තවල පිටපතක් වෙනත් ආරක්ෂිත ස්ථානයක ගබඩා කිරීම මෙහි මූලික කාර්යය වේ.
2) *ආකෘතීකරණය (disk formatting)* – මෙම ක්‍රියාවලිය මඟින් දෘඩ තැටියක හෝ USB ධාවකයක (drive) දැනට පවතින සියලුම දත්ත මකා දමන අතර, අලුතින් ලිවීම සඳහා ගොනු පද්ධති ව්‍යුහය (file system structure) සකස් කරයි.
3) *ගොනු සංකෝචනය (file compression)* – දත්තවල ගුණාත්මකභාවය වෙනස් කර හෝ වෙනස් නොකර, දත්ත ගබඩා ඉඩ ඉතිරි කර ගත හැකිවන පරිදි ගොනු විශාලත්වය අඩු කිරීමයි.
4) *තැටි පංගු බෙදීම (disk partition)* –දත්ත ගබඩා කිරීමේ වේගය වැඩි දියුණු කිරීම සඳහා, ඛණ්ඩනය වූ (fragmented) ගොනු කොටස් නැවත එකට එකතු කර අඛණ්ඩ කොටස් ලෙස සංවිධානය කිරීම මෙහිදී සිදු වේ.


02. පහත සඳහන් උපාංග සමූහයන්ගෙන්, **ආදාන උපාංග** (*input devices*) ***පමණක්*** අඩංගු සමූහය කුමක්ද?

1) යතුරුපුවරුව (*keyboard*), ස්පීකරය (*speaker*), ස්කෑනරය/සුපරීක්ෂකය (*scanner*)
2) මොනිටරය (*monitor*), ප්‍රක්ෂේපන යන්ත්‍රය (*projector*), මුද්‍රණ යන්ත්‍රය (*printer*)
3) මූසිකය (*mouse*), මයික්‍රෆෝනය (*microphone*), ජොයිස්ටික්/ මෙහෙයුම් යටිය (*joystick*)
4) ස්පර්ශ සංවේදී තිරය (*touch screen*), කැමරාව (*camera*), ප්ලොටරය/ලකුණුකරණය (*plotter*)

03. පහත සඳහන් උපාංග සමූහයන්ගෙන්, චුම්බක මාධ්‍ය (*magnetic media*), ආලෝක මාධ්‍ය (*optical media*), සහ ඝන මාධ්‍ය (*solid state media*) යන ද්විතියික ආචයන වර්ග තුනම නිවැරදි පිළිවෙළට නිරූපණය කරන සමූහය කුමක්ද?

1) දෘඩ තැටිය (*hard disk drive - HDD*), සැනෙළි ධාවකය (*flash drive*), සංයුක්ත තැටිය (*CD*)
2) සංඛ්‍යාංක බහුවිධ තැටිය (*DVD*), චුම්බක පටිය (*magnetic tape*), මතක කාඩ්පත් (*memory card*)
3) චුම්බක පටිය (*magnetic tape*), *blu-ray* තැටිය, සැනෙළි ධාවකය (*flash drive*)
4) මතක කාඩ්පත් (*memory card*), දෘඩ තැටිය (*HDD*), සංයුක්ත තැටිය (*CD*)

04. පහත x ලෙස දක්වා ඇති උපාංගය සහ පරිගණක ජාලයේ ජාල ස්ථලකය නිවැරදිව දක්වන වරණය තෝරන්න.



රූපය 1:

1) ගිණි පවුර, තරු ආකාරයේ ජාල
2) ස්විචය, වලලු ආකාරයේ ජාල
3) ස්විචය, දැල් ආකරයේ ජාලය
4) ගිණි පවුර, දැල් ආකරයේ ජාලය

05. ස්විචයක් (*switch*) සහ නාභියක් (*hub*) අතර වෙනස්කම් නිවැරදිව පැහැදිලි කරන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශයද?

1) නාභිය සාමාන්‍යයෙන් පූර්ණ ද්විපත (*full-duplex*) ආකාරයෙන් ක්‍රියා කරන අතර, එය එකවර දත්ත යැවීමට සහ ලබා ගැනීමට ඉඩ සලසයි. ස්විචය සාමාන්‍යයෙන් අර්ධ ද්විපත (*half-duplex*) ආකාරයෙන් ක්‍රියා කරන අතර, එයට එකවර එක් කාර්යයක් පමණක් (දත්ත පැකැට්ටු යැවීම හෝ ලබා ගැනීම) කළ හැකිය.
2) නාභිය සියළුම සම්බන්ධිත උපාංග වෙත දත්ත විකාශනය (*broadcast*) කරන අතර අර්ධ ද්විපත (*half-duplex*) ආකාරයෙන් ක්‍රියා කරයි. ස්විචය ඉලක්කගත උපාංගයට පමණක් දත්ත යොමු කරන අතර සාමාන්‍යයෙන් පූර්ණ ද්විපත (*full-duplex*) ආකාරයෙන් ක්‍රියා කරයි
3) ස්විචය සියළුම සම්බන්ධිත උපාංග වෙත දත්ත විකාශනය කරන අතර පූර්ණ ද්විපත (*full-duplex*) ආකාරයෙන් ක්‍රියා කරයි. නාභිය ඉලක්කගත උපාංගයට පමණක් දත්ත යොමු කරන අතර සාමාන්‍යයෙන් අර්ධ ද්විපත (*half-duplex*) ආකාරයෙන් ක්‍රියා කරයි
4) ස්විචය සහ නාභිය යන දෙකම සෑම විටම ඒකපත (*simplex*) ආකාරයෙන් පමණක් ක්‍රියා කරන අතර, දත්ත සම්ප්‍රේෂණය සිදුවන්නේ එක් දිශාවකට පමණි.

06. ද්විමය 111010010_2 ට තුල්‍ය අෂ්ටක (*octal*) සංඛ්‍යාව කුමක් ද?

1) 744_8 2) 722_8 3) 711_8 4) 752_8

07. ද්විමය 11101001_2 ට තුල්‍ය දශමක (*decimal*) සංඛ්‍යාව කුමක් ද?

1) 233_{10} 2) 231_{10} 3) 230_{10} 4) 237_{10}

08. පහත දක්වා ඇති ගොනු සමූහය (*files*) Flash ධාවකයකට (*flash drive*) පිටපත් කිරීමට අවශ්‍ය වේ.

- පින්තූර එකතුව (*photos.zip*): 1.5 GB
- ප්‍රධාන ඉදිරිපත් කිරීම (*presentation.ppt):* 800 MB
- කාර්ය සටහන් (*notes.txt*): 1.2 KB
- උපස්ථ වීඩියෝව (*backup.mov*): 3.5 GB

මෙම සියලු ගොනු **සාර්ථකව** ගබඩා කිරීම සඳහා අවශ්‍ය වන, **අවම ධාරිතාවක්** සහිත සැනෙළි ධාවකය (USB Flash Drive) පහත සඳහන් කුමන එකක්ද?

1) 4 GB 2) 6 GB 3) 8 GB 4) 16 GB

09. පහත දක්වා ඇති ASCII අක්ෂර කට්ටලයේ කේත (*decimal values*) සලකා බලන්න:

- විශාල ඉංග්‍රීසි අකුර 'A' (Capital 'A'): 65
- කුඩා ඉංග්‍රීසි අකුර 'a' (Lowercase 'a'): 97
- ඉලක්කම් අක්ෂරය '0' (Digit '0'): 48

රූපය 2:

මෙම තොරතුරු මත පදනම්ව, විශාල ඉංග්‍රීසි අකුර 'F' සහ කුඩා ඉංග්‍රීසි අකුර 'c' සඳහා වන ASCII දශම අගයන් පිළිවෙලින් සඳහන්ව ඇත්තේ?


1) 70, 99 2) 69, 98 3) 71, 100 4) 70, 100

10. පහත දක්වා ඇති ප්‍රකාශ සලකා බලන්න.
    A. ඇන්ඩ්‍රොයිඩ් *(android)* යනු ප්‍රධාන වශයෙන් ජංගම දුරකතන සඳහා නිර්මාණය කර ඇති මෙහෙයුම් පද්ධතියකි.
    B. ලිඛිත ලේඛන සැකසීම සඳහා භාවිතා කරන *libre office* යනු මෙහෙයුම් පද්ධතියකට උදාහරණයකි.
    C. මැක් ඕඑස් (*macOS*), වින්ඩෝස් (*windows*) සහ උබුන්ටු (*ubuntu*) යනු පරිගණක සඳහා ඇති මෙහෙයුම් පද්ධතිවලට උදාහරණ වේ.
    D. මූවි මේකර් (*movie maker*) යනු වීඩියෝ සංස්කරණය සඳහා භාවිතා කරන මෙහෙයුම් පද්ධතියකි.

    ඉහත ප්‍රකාශ අතුරින් **නිවැරදි** ප්‍රකාශ/ප්‍රකාශන දැක්වෙන පිළිතුර තෝරන්න.

    1) A සහ Bපමණි.
    2) A සහ Cපමණි.
    3) B, C සහ D පමණි
    4) A, B, C සහ D සියල්ලම.

11. ඉහත රූපයේ දැක්වෙන 'Aa' මෙනුව (*change case function*) භාවිතා කරමින්, ඔබ තෝරාගත් පාඨ කොටසක් (*text*) පහත සඳහන් ආකාරයට වෙනස් කිරීමට අවශ්‍ය වේ:



රූපය 3:

    මුල් පාඨ කොටස:

    The quick brown Fox Jumps over The lazy Dog.

    වෙනස් කළ යුතු ආකාරය:

    tHE QUICK BROWN fOX jUMPS OVER tHE LAZY dOG.

    ඉහත පරිවර්තනය සිදු කිරීම සඳහා ඔබ රූපයේ දැක්වෙන විකල්ප අතරින් තෝරාගත යුත්තේ කුමක්ද?

    1) Sentence case
    2) Capitalize Each Word
    3) UPPERCASE
    4) tOGGLE cASE

12. වදන් සැකසුම් මෘදුකාංගයක (*a word Processing software*) ඔබ විසින් පිටපත් කළ (*copy*) හෝ කපා ගත් (*cut*) පාඨ කොටසක් (*text*) ලේඛනයට ඇතුළු කිරීමට (ඇලවීමට) භාවිතා කරන කෙටිමං යතුරු සංයෝජනය (*short cut key*) **සහ** ලේඛනය මුද්‍රණය කිරීමට (*print*) භාවිතා කරන කෙටිමං යතුරු සංයෝජනය පිළිවෙළින් දැක්වෙන්නේ?

    1) Ctrl+X, Ctrl+S 2) Ctrl+C, Ctrl+F 3) Ctrl+V, Ctrl+P 4) Ctrl+V , Ctrl+C

13. පහත දක්වා ඇති ප්‍රකාශයන්ගෙන් පැතුරුම්පතක (*spreadsheet*) ප්‍රධාන සංකල්ප පිළිබඳව ***සාවද්‍ය*** ප්‍රකාශය තෝරන්න.

    1) සක්‍රීය කෝෂය (*active cell*) යනු මේ මොහොතේ පරිශීලකයා විසින් තෝරාගෙන ඇති කෝෂය වන අතර, ඕනෑම දත්තයක් ඇතුළු කරන්නේ එම කෝෂයට ය.
    2) *function box* (හෝ *formula bar)* තුළ සක්‍රීය කෝෂයෙහි ඇති සූත්‍රයක් (*formula*) පෙන්නුම් කරන අතර, එම සූත්‍රයෙන් ලැබෙන අවසාන අගය කෝෂය තුළ පෙන්වයි.
    3) *name box* මඟින් තෝරාගත් සක්‍රීය කෝෂයේ (*active cell*) කෝෂ ලිපිනය (*cell address*) පෙන්වයි.
    4) කෝෂ පරාසයක් (*cell range*) යනු තීරු නාමය සහ පේළි අංකය සංයෝජනයෙන් සකස් කරන නාමයයි.

- ප්‍රශ්න අංක 14 ට සහ 15 ට පිළිතුරු සැපයීමට පහත පැතුරුම් පත් කොටස භාවිත කරන්න

	A	B	C	D	E	F	G
1	Item (භාණ්ඩය)	Unit Price (ඒකක මිල)	Quantity (ප්‍රමාණය)	Total (මුළු අගය)	Discounted Total (වට්ටමට පසු මුළු අගය)	Discount (වට්ටම)	5%
2	Laptop	85000	3	255000	242250		
3	Mouse	1200	15	18000	17100		
4	Keyboard	3500	8	28000	26600		
5	Monitor	45000	2	90000	85500		

වගුව 01:

14. D2 කෝෂයට මුළු අගය ලබාගැනීමට ලිවිය යුතු සූත්‍රය කුමක් ද?

1) =SUM(B2:C2) 2) =B2*C2 3) =B2+C2 4) =B2 - (B2*C2)

15. කෝෂයොමු පමණක් භාවිකර (using cell reference) සහ F3:F5 පරාසයට පිටපත් කර පිළිතුරු ලැබිය හැකි පරිදි; වට්ටමට පසු මුළු අගය (Discounted Total) ලබාගැනීමට E2 කෝෂයෙහි ලිවිය යුතු නිවැරදි සූත්‍රය මින් කුමක් ද?

1) =D2*5% 2) =D2*G1 3) =D2-(D2*5%) 4) =D2-(D2*G1)

16. පහත දක්වා ඇති ලක්ෂණ අතුරින් ගුණාත්මක සමර්පණයක් (*e - presentation*) සකස් කිරීමේදී නිවැරදි භාවිතයන් ලෙස සැලකිය හැක්කේ කුමන ප්‍රකාශයන්ද?

a) අවම වශයෙන් අකුරු පොයින්ට්ස් 32 ක ප්‍රමාණයකින් ප්‍රධාන ශීර්ෂ (*headings*) සහ අන්තර්ගතය (*content*) ඉදිරිපත් කිරීම.
b) එකම කදාව (*slide*) තුළ අන්තර්ගතය පැහැදිලි කිරීමට වීඩියෝ කිහිපයක් එකවර ඇතුළත් කිරීම
c) පසුබිම් වර්ණය (*background color*) ලෙස තද පැහැයක් (*dark*) තෝරාගෙන, අක්ෂර වර්ණය (*font color*) ලෙස ලා පැහැයක් (*light*) යොදා ගැනීම.
d) පසුබිම් වර්ණය ලා පැහැයක් (*light color*) යොදාගෙන, අක්ෂර වර්ණය තද පැහැයක් (*dark color*) යොදා ගැනීම.

1) a සහ b පමණි. 2) b සහ c පමණි. 3) a සහ d පමණි. 4) a, b සහ d පමණි.

- **<u>ප්‍රශ්න අංක 17 සිට 19 කෙත් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත පෙන්වා ඇති වගු භාවිත කරන්න</u>**

මෙය 'සිනමා ප්‍රදර්ශන වෙන්කිරීම' (Movie Booking) පිළිබඳ දත්ත සමුදායක වගු කිහිපයකි. මෙහි Genre යනු චිත්‍රපටයේ වර්ගයයි.

MOVIE (චිත්‍රපටය) වගුව

Movie_ID	Title	Genre
M001	Oppenheimer	Drama
M002	Godzilla	Action
M003	Interstellar	Sci-Fi
M004	The Creator	Sci-Fi

වගුව 02:

SCREENING (ප්‍රදර්ශනය) වගුව

Screen_ID	Movie_ID	Time	Price
S101	M001	19:30	1200
S102	M003	14:00	1000
S103	M001	22:00	1500
S104	M002	17:00	1200

වගුව 03:

TICKET (ටිකට්පත්) වගුව

Ticket_ID	Screen_ID	Seat_No	Booking_Date
T001	S101	A12	2025-11-18
T002	S101	A13	2025-11-18
T003	S102	B05	2025-11-18
T004	S104	C01	2025-11-19

වගුව 04:

17. SCREENING (ප්‍රදර්ශනය) වගුවේ ප්‍රාථමික යතුර (primary key) සඳහා වඩාත් සුදුසු වනනේ කුමක්ද?

1) Screen_ID 2) Movie_ID 3) Screen_ID + Movie_ID 4) Time

18. මෙම සමුදායේ ආගන්තුක යතුරක් (foreign key) වන්නේ කුමක්ද?

1) TICKET (ටිකට්පත්) වගුව - Ticket_ID
2) SCREENING (ප්‍රදර්ශනය) වගුව - Movie_ID
3) SCREENING (ප්‍රදර්ශනය) වගුව - Screen_ID
4) TICKET (ටිකට්පත්) වගුව - Seat_No

19. SCREENING (ප්‍රදර්ශනය) වගුවේ Price ක්ෂේත්‍රය සඳහා වඩාත් ගැළපෙන දත්ත ප්‍රරූපය (data type) වන්නේ.

1) Number 2) Text 3) Currency 4) Boolean

20. වගුවක ඇති ක්ෂේත්‍ර (*fields*) දෙකක් හෝ වැඩි ගණනක් එක්වී, එහි ඇති එක් එක් රෙකෝඩ (*record*) අනන්‍ය ලෙස හඳුනා ගැනීමට භාවිතා කරන යතුර *(key)* හඳුන්වන්නේ කුමන නමකින්ද?

1) ආගන්තුක යතුර (*foreign key*)
2) සංයුක්ත ප්‍රාථමික යතුර (*composite primary key*)
3) අපේක්ෂක යතුර (*candidate key*)
4) විකල්ප යතුර (*alternate key*)

21. විදුලි බිල (*electricity bill*) ගණනය කිරීමේ ඇල්ගොරිතමයක් සලකා බලන්න. පාරිභෝගිකයෙකු ගෙවිය යුතු **මුළු මුදල** (*total charge*) ගණනය කිරීම සඳහා පහත කොන්දේසි යටතේ ක්‍රියාවලිය සිදුවේ:

* ආදානය (*Inputs*): පරිභෝජනය කළ විදුලි ඒකක ගණන (*Units*) සහ පරිශීලක වර්ගය (*Category*) (ගෘහස්ථ/ව්‍යාපාරික).
* ක්‍රියාවලිය (Process):
  - ඒකක ගණන 50ට අඩු නම්, ඒකක එකකට රුපියල් 10 බැගින් අය කරයි.
  - ඒකක ගණන 50 හෝ ඊට වැඩි නමුත් 100ට අඩු නම්, ඒකක එකකට රුපියල් 15 බැගින් අය කරයි.
  - ඒකක ගණන 100 හෝ ඊට වැඩි නම්, ඒකක එකකට රුපියල් 20 බැගින් අය කරයි.
  - ඊට අමතරව, පරිශීලක වර්ගය ව්‍යාපාරික නම්, අවසාන ගාස්තුවට 20% ක සේවා බද්දක් (*service tax*) එකතු කරයි.

මෙම ගණනය කිරීමේ ක්‍රියාවලිය (Process) ඇල්ගොරිතමයකට අනුව නිවැරදිව නිරූපණය කරන්නේ පහත සඳහන් කුමන වගන්තියේ ද?

1) මුලින්ම ඒකක ගණන පරීක්ෂා කර මූලික ගාස්තුව (*base charge*) ගණනය කරන අතර, ඉන්පසු පරිශීලක වර්ගය මත පදනම්ව සේවා බද්ද (*service tax*) එකතු කළ යුතුදැයි තීරණය කරයි.
2) මුලින්ම සේවා බද්ද ගණනය කර අවසානයේ ඒකක ගණන පරීක්ෂා කර මූලික ගාස්තුව තීරණය කරයි.
3) පරිශීලක වර්ගය කුමක් වුවත් ඒකක ගණන මත පමණක් පදනම්ව අවසාන ගාස්තුව ගණනය කරයි.
4) ඒකක ගණන සහ පරිශීලක වර්ගය යන දත්ත දෙකම පරීක්ෂා නොකර සෘජුවම අවසාන ගාස්තුව ලබා දෙයි

22 කොන්දේසියක් මත පදනම්ව කේත කොටස් දෙකකින් එකක් තෝරා ක්‍රියාත්මක කිරීමට (*choose*) භාවිතා කරන පාලන ව්‍යුහය කුමක්ද?

1) පුණරාවර්තනයකි 2) වරණයකි 3) පුනරාවර්තනයකි. 4) අනුක්‍රමයකි

23. පහත දැක්වෙන S තාර්කික ප්‍රකාශය සලකන්න.

```
S:(X≥50) OR (NOT (Y<10))
```

රූපය 4:

X සහ Y අගයන් පිළිවෙලින් 40 සහ 15 වේ නම්, S ප්‍රකාශයේ ප්‍රතිඵලය වන්නේ පහත සඳහන් කවරක්ද?

1) True 2) False 3) True and False 4) ප්‍රතිඵලයක් නැත (No results)

24. පහත දක්වා ඇති ගණිතමය ප්‍රකාශනයේ ප්‍රතිඵලය කුමක් වේද?

```
(12-4)×3-20 div 4
```

රූපය 5:

1) 4 2) 19 3) 14 4) 12

- **ප්‍රශ්න අංක 25,26 සහ 27 පහත සඳහා පිළිවෙළින් කේත කොටස 1, 2 සහ 3 අදාල වේ**

කේත කොටස 1:

```
x:=5;
while x≤20 do
     x:=x+3;
writeln(x);
```

රූපය 6:

කේත කොටස 2:

```
var
  i:integer;
begin
   for i:= 2 to 10 step 2 do
      if i > 4 then
          write(i);
end.
```

රූපය 7:

කේත කොටස 3:

```
if (marks≥35) then
     writeln('A')
else if (marks≥25) then
     writeln('B')
else if (marks≥15) then
     writeln('C')
else
     writeln('F');
```

රූපය 8:

25 කේත කොටස 1 හි දක්වා ඇති ව්‍යාජ කේතය ක්‍රියාත්මක කිරීමෙන් පසු `writeln('F');` විධානය මඟින් ප්‍රතිදානය (*output*) ලෙස ලැබෙන අවසාන අගය කුමක්ද?

1) 26 2) 23 3) 20 4) 30

26 කේත කොටස 2 හි දක්වා ඇති ඇති ව්‍යාජ කේතයෙහි ප්‍රතිදානය කුමක් ද?

1) 6
8
10 2) 6810 3) 4
6
8 4) 468

27 කේත කොටස 3 ට **අදාලව** Marks සඳහා පිළිළෙින් 40, 20 සහ 16 යන ආදනයන් ලබාදුන්නේ නම් ලැබිය හැකි ප්‍රතිදානය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

1) A C C 2) A B F 3) A F F 4) C F F

28 පහත දක්වා ඇති ව්‍යාජ කේත කොටස (Pseudo-code) සලකා බලන්න.

```
Var
  arrScores : array[0..4] of integer;
begin
  arrScores[0] := 10;
  arrScores[1] := 5;
  arrScores[3] := 2;
  arrScores[4] := arrScores[0] * arrScores[1] - arrScores[3];
end;
```

රූපය 9:

ඉහත කේතය ක්‍රියාත්මක කිරීමෙන් පසු `arrScores[4]` හි අගය කුමක් වේද?

1) 48 2) 13 3) 7 4) 50

29. පහත දක්වා ඇති ප්‍රකාශයන්ගෙන් ඇසෙම්බ්ලරයක් (*assembler*), අර්ථ විනාශකයක් (*interpreter*) සහ සම්පාදකයක් (*compiler*) සම්බන්ධයෙන් වන **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

1) සම්පාදකය මඟින් මුළු වැඩසටහනම එකවර යන්ත්‍ර කේතයට (*machine code*) පරිවර්තනය කරන අතර, අර්ථ විනාශකය කේතය පේළියෙන් පේළියට ක්‍රියාත්මක කරයි. **ඇසෙම්බ්ලරය** මඟින් C++ වැනි ඉහළ මට්ටමේ භාෂා (*high-level languages*) පරිවර්තනය කරයි.

2) ඇසෙම්බ්ලරය මඟින් වැඩසටහන පේළියෙන් පේළියට ක්‍රියාත්මක කරන අතර, **අර්ථ විනාශකය** මඟින් එකම යන්ත්‍ර කේතයක් නිර්මාණය කරයි. **සම්පාදකය** මඟින් ඇසෙම්බ්ලි භාෂා කේතය යන්ත්‍ර කේතයට පරිවර්තනය කරයි.

3) ඇසෙම්බ්ලරය මඟින් ඇසෙම්බ්ලි භාෂා කේතය (*assembly language code*) යන්ත්‍ර කේතයට පරිවර්තනය කරයි. **සම්පාදකය** මඟින් ඉහළ මට්ටමේ කේතය මුළුමනින්ම යන්ත්‍ර කේතයට පරිවර්තනය කරන අතර, **අර්ථ විනාශකය** මඟින් එය පේළියෙන් පේළියට පරිවර්තනය කර ක්‍රියාත්මක කරයි

4) සම්පාදකය මඟින් ඇසෙම්බ්ලි භාෂා කේතය පරිවර්තනය කරන අතර, **ඇසෙම්බ්ලරය** මඟින් ඉහළ මට්ටමේ කේතය පේළියෙන් පේළියට ක්‍රියාත්මක කරයි. **අර්ථ විනාශකය** මඟින් මුළු වැඩසටහනම එකවර පරිවර්තනය කරයි

30. SDLC අදියරයන් වන: පද්ධති විශ්ලේෂණය (*system analysis*), පද්ධති නඩත්තුව (*system maintenance*), පද්ධති හඳුනාගැනීම (*system identification*) සහ පද්ධති සංවර්ධනය (*system development*) යන්න නිවැරදි තාර්කික අනුපිළිවෙලින් දක්වා ඇත්තේ පහත සඳහන් කවරකද?

1) පද්ධති හඳුනාගැනීම → පද්ධති විශ්ලේෂණය → පද්ධති නඩත්තුව → පද්ධති සංවර්ධනය
2) පද්ධති විශ්ලේෂණය → පද්ධති හඳුනාගැනීම → පද්ධති සංවර්ධනය → පද්ධති නඩත්තුව
3) පද්ධති හඳුනාගැනීම → පද්ධති විශ්ලේෂණය → පද්ධති සංවර්ධනය → පද්ධති නඩත්තුව
4) පද්ධති සංවර්ධනය → පද්ධති හඳුනාගැනීම → පද්ධති විශ්ලේෂණය → පද්ධති නඩත්තුව

31. පහත දක්වා ඇති සම්පූර්ණ URL ලිපිනය සලකන්න:

```
https://www.company.lk/products/details.php
```

රූපය 10:

මෙම URL ලිපිනයෙහි *www.* , *company.lk* සහ *details.php* යන කොටස්වලින් පිළිවෙලින් නිරූපණය කරන්නේ ?

1) නියමාවලිය , වසම් නාමය සහ සේවාව
2) වසම් නාමය, සම්පතට මාර්ගය (*path*) සහ ගොනුව
3) සේවාව, වසම් නාමය සහ ගොනුව (*file*)
4) සම්පතට මාර්ගය (*path*) - නියමාවලිය සහ ගොනුව

32. පරිගණක ජාලකරණයේදී, DNS (*Domain Name System*) හි **ප්‍රධාන** කාර්යය වන්නේ

1) වෙබ් ලිපිනයක් (URL) එයට අදාළ වන MAC ලිපිනය (*MAC Address*) බවට පරිවර්තනය කිරීම.
2) පොදු IP ලිපිනයන් (public IP addresses) පුද්ගලික IP ලිපිනයන් (*private IP addresses*) බවට පරිවර්තනය කිරීම
3) වසම් නාමයක් (*domain name*) එයට අදාළ වන IP ලිපිනයක් (*IP address*) බවට පරිවර්තනය කිරීම
4) http ඉල්ලීම් (*requests*) https ඉල්ලීම් බවට පරිවර්තනය කිරීම.

33. දකුණු පසින් ඇති කොටුවෙහි දැක්වෙන ගොනු දිගු (file extensions) සහ ඒවා අයත් වන ප්‍රධාන ගොනු ප්‍රරූප (File types) නිවැරදිව සැසඳෙන විකල්පය තෝරන්න.

1) ශ්‍රව්‍ය, පින්තූර, ලේඛන
2) පින්තූර, ලේඛන, ශ්‍රව්‍ය
3) ලේඛන, පින්තූර, ශ්‍රව්‍ය
4) ලේඛන, ශ්‍රව්‍ය, පින්තූර

```
1. .docx, .pptx, .xlsx
2. .jpg, .png, .bmp
3. .mp3, .midi, .wav
```

රූපය 11:

34. පික්සලයක් සඳහා **බයිට් 2ක (2 Bytes)** මතකයක් වෙන් කර ඇත්නම්, එම පික්සලයෙන් නිරූපණය කළ හැකි උපරිම වර්ණ සංඛ්‍යාව කොපමණද?

$(2^2 = 4,\ 2^3 = 8,\ 2^{10} = 1024,\ 2^{16} = 65536\ \ 2^{20} = 1048576)$


රූපය 12:

1) 4 2) 1024 3) 65,536 4) 1048576

35. පහත සඳහන් ප්‍රකාශ හතර අතරින්, **වෙක්ටර් ග්‍රැෆික්ස්** (*vector graphics*) වල ප්‍රධාන ලක්ෂණයක් සහ එය **රාස්ටර් ග්‍රැෆික්ස්** (*raster graphics*) වලින් වෙනස් වන ආකාරය නිවැරදිව පැහැදිලි කරන ප්‍රකාශය තෝරන්න.

1) වෙක්ටර් ග්‍රැෆික්ස්; ඡායාරූප (*photographs*) සඳහා වඩාත් සුදුසු වන අතර, ඒවා විශාල කිරීමේදී පික්සලීකරණය වීම (*pixelation*) සිදු වේ.
2) රාස්ටර් ග්‍රැෆික්ස්; ගණිතමය සූත්‍ර (*mathematical formulas*) භාවිතයෙන් නිර්මාණය වන අතර, ඒවා සාමාන්‍යයෙන් .SVG හෝ .AI ආකෘතිවලින් සුරැකේ
3) වෙක්ටර් ග්‍රැෆික්ස් විවිධ වර්ණ පික්සල සමූහයකින් සෑදී ඇති අතර, ඒවායේ ගොනු ප්‍රමාණය විශාල කිරීමේදී වැඩි වේ
4) වෙක්ටර් ග්‍රැෆික්ස් ගණිතමය සූත්‍ර මත පදනම් වන අතර, ඒවායේ ගුණාත්මක භාවය අඩුවීමකින් තොරව ඕනෑම ප්‍රමාණයකට විශාල (*scale*) කළ හැකිය.

36. ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග වල ඇති පහත දක්වා ඇති නිරූපකයේ (*icon*) කාර්යය කුමක්ද?



රූපය 13:

1) ශබ්දය වැඩි කිරීම (*amplify*)
2) ශබ්දයේ වේගය අඩු කිරීම (*change tempo*)
3) තෝරාගත් කොටසට නිශ්ශබ්දතාවය ඇතුල් කිරීම (*generate silence*)
4) තෝරාගත් කොටස ඉවත් කිරීම (*delete/cut*)


37. 600 Pixels පළල, 400 Pixels දිග, සහ 24 Bits per Pixel වර්ණ ගැඹුරක් (*color depth*) සහිත සංකෝචනය නොකළ (*uncompressed*) රූප ගොනුවක විශාලත්වය Kilobytes (KB) වලින් නිවැරදිව ගණනය කරන ක්‍රමය කුමක්ද?

1) දිග, පළල සහ පික්සලයකට බිටු ගණන ගුණ කර, එම අගය 8 න් බෙදා, ලැබෙන අගය 1024 න් බෙදීම
2) දිග සහ පළල ගුණ කර, එම අගය 24 න් බෙදා, ලැබෙන අගය1000 න් බෙදීම
3) දිග, පළල සහ 8 ගුණ කර, එම අගය 24 න් බෙදා, ලැබෙන අගය 1024 න් බෙදීම.
4) මුළු පික්සල ගණන 24 න් බෙදා, එම අගය 8 න් සහ 1000 න් ගුණ කිරීම.

38. පහත දක්වා ඇත්තේ එකිනෙකට වෙනස් ලැයිස්තු වර්ග තුනක් සහ ඒවායේ නිවැරදි ආරම්භක උසුලනය දැක්වෙන HTML කේත සමූහයකි. ලැයිස්තු 3 සහ ආරම්භක උසුලන 3 නිවැරදිව දක්වා ඇති වරණය කුමක්ද?

1) Unordered List: <li>, Ordered List: <ol>, Nested List: <nl>
2) Definition List: <dl>, Ordered List: <ul>, Menu List: <ml>
3) Numbered List: <nl>, Bulleted List: <bl>, Definition List: <dd>
4) Unordered List : <ul>, Ordered List : <ol>, Definition List: <dl>

39. HTML උසුලනයක කොටස් නම්කර ඇති පහත සටහන සළකන්න. එහි X, Y සහ Z යන ලේබලවලට සුදුසු පදය පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.



රූපය 14:

1) X:උසුලනය (element), → Y: උපලක්ෂණය (attribute), → Z: අගය (values).
2) X: අගය(values), → Y: උසුලනය(element), → Z: උපලක්ෂණය(attribute)
3) X: උසුලනය, (element) → Y: අගය(values), → Z: උපලක්ෂණය(attribute)
4) X: උපලක්ෂණය (attribute) → Y: උසුලනය(element), → Z: අගය.

40. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය (*e-Waste*) වැරදි ලෙස බැහැර කිරීමේදී ඇතිවන ප්‍රධානම පාරිසරික සහ සෞඛ්‍ය අවදානම කුමක්ද?

1) පරිසරයට විශාල වශයෙන් කාබන් ඩයොක්සයිඩ් (CO_2) මුදා හැරීම
2) භාවිතා කරන ලද බැටරිවල අඩංගු රසායනික ද්‍රව්‍ය මගින් පසෙහි සාරවත්භාවය අඩු වීම.
3) ඊයම් (*lead*), රසදිය (*mercury*) සහ කැඩ්මියම් (*cadmium*) වැනි විෂ සහිත බැර ලෝහ (*heavy metals*) පසට සහ ජලයට එකතු වීම
4) අලුත් ඉලෙක්ට්‍රොනික උපකරණ නිෂ්පාදනය කිරීමට වැය වන පිරිවැය වැඩි වීම.

***

සියළු ම හිමිකම් ඇවිරිණි [All rights Reserved]

Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kaha
ජානක පුෂ්පකුමාර ප්‍රශ්න පත්‍ර සේවාව
Janaka Pushpakumara Paper Service
Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta Janaka Pushpakumara-Kahawatta

80	S	I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2025(2026) පෙරහුරු විභාගය
General Certificate of Education (Ord. Level) – 2025 (2026) Practice Test

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	**I, II**
Information and Communication Technology	**I, II**

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 Minutes



M-01 **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II**

උපදෙස්:

* **පළමුවන ප්‍රශ්නයට** හා තවත් තෝරාගත් ප්‍රශ්න **හතරක්ද** ඇතුළුව **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට **ලකුණු 20** ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම **ලකුණු 10** බැගින් හිමි වේ.

---

1. i) පහත ***අවස්ථාව 1*** සහ ***අවස්ථාව 2*** යනුවෙන් දක්වා ඇත්තේ එකිනෙකට වෙනස් අවස්ථා දෙකක දී සිදුකළ දත්ත රැස්කිරීම් දෙකකි.

අවස්ථාව 1	අවස්ථාව 2
* පසුගිය මාසයේ පැවති ගණිත පරීක්ෂණයේදී ළමුන් 5 දෙනෙකු ලබාගත් ලකුණු පහත දැක්වේ. * **දත්ත:** 75, 40, 92, 60, 83 (මේවා එක් එක් සිසුවා ලබාගත් ලකුණු වේ) **GRADE 10 MATH TEST RESULTS**  	* සතියක කාලයක් සඳහා කුකුළු ගොවිපළකින් ලබාගත් දත්ත පහත දැක්වේ. * **දත්ත:** 45, 42, 40, 41, 44, 43, 45 (මේවා එකතු කළ බිත්තර ගණන් වේ) **WEEKLY EGG PRODUCTION** 

රූපය 15:

ඉහත එක්එක් අවස්ථාවල පවතින දත්ත ආශ්‍රයෙන් සකස් කරගත හැකි තොරතුරු **දෙකක්** වෙන වෙනම ලියන්න. (අවස්ථාව 1හි සඳහන් දත්ත මගින් ව්‍යුත්පන්න කරගත හැකි තොරතුරු දෙකක් ද, අවස්ථාව 2 හි සඳහන් දත්ත මගින් ව්‍යුත්පන්න කළ හැකි තොරතුරු දෙකක් ද සඳහන් කරන්න.)

ii)

1. නවීන පරිගණක තිරයක් (රූපය සහ ශබ්දය එකම රැහැනක යැවිය යුතු)	A. USB
2. පැරණි ප්‍රොජෙක්ටරය (ප්‍රක්ෂේපන යන්ත්‍රයක්) (old multimedia projector) (රූපය පමණක් යැවීම ප්‍රමාණවත් ය)	B. HDMI
3. බාහිර දෘඩ තැටිය (External HDD)	C. VGA
4. හෙඩ්ෆෝනය (Headphone)	D. Audio

වගුව 05:

දී ඇති උපකරණ සම්බන්ධ කළ හැකි **වඩාත් සුදුසුම** කෙවෙනිය තෝරා අංකය ඉදිරියෙන් ලෙබලය එන සේ ලියන්න.

iii) a) 1011011000011110_2 යන ද්වීමය සංඛ්‍යාවට තුල්‍ය ශඩ්දශමක සංඛ්‍යාව බවට හරවන්න.

b) 139_{10} යන දශමක සංඛ්‍යාව අෂ්ටක සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න.

iv) a) AND, NOT සහ OR ද්වාර පමණක් ඇතුළත් කරමින් $(x.x) + (x.y) . (y.y) = R$ බූලීය ප්‍රකාශනයට අදාල තාර්කික පරිපථය අඳින්න.

b) ඉහත බූලීය ප්‍රකාශයට අදාල පහත සත්‍යතා වගුව සම්පූර්ණ කරන්න.

x	y	x.x	y.y	x.y	.....	.....
0	0	.....	.....	.....	.....	.....
0	1	.....	.....	.....	.....	.....
1	0	.....	.....	.....	.....	.....
1	1	.....	.....	.....	.....	.....

වගුව 06:


v) a) පරිශීලකයෙකු යෙදුමක් හරහා මුද්‍රණ විධානයක් ලබා දුන් විට, දත්ත සහ සම්පත් භාවිතා කිරීමේ පාලනය P→Q→R→utility→S ලෙස දක්වා ඇත. එහි P,Q,R සහ S සඳහා සුදුසු පද පහත ලැයිස්තුවෙන් තෝරා ලේබලය ඉදිරියෙන් ලියන්න.

ලැයිස්තුව: { Application/ User / ~~Utility~~ /Hardware/ OS}

b) ඒක පරිශීලක ඒක කාර්ය (single user -single tasking) මෙහෙයුම් පද්ධතියක් පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා නම් කරන්න.

ලැයිස්තුව: { Windows XP/ Linux / DOS /Mac Os/ Fedora}

vi)



රූපය 16:

a) ඉහත කදාව නිර්මාණය කිරීමට යොදාගෙන ඇති කදා පිරිවැසුම (slide layout) නොගැලපේ. ඒ වෙනුවට යොදාගත යුතුව තිබුණේ කුමන කදා පිරිවැසුම ද?

b) සජීවනය 1 යටතේ සක්‍රීයව පෙන්වනනේ object1, object2 සහ object3 යන වස්තු අතරින් කුමන වස්තුවට ඇතුළත් කරන ලද සජීවීකරණයක් ද?

vii) පහත සඳහන් ව්‍යාජ කේතය නිරූපනයට සුදුසු ගැලීම් සටහනක් අඳින්න.

```
BEGIN
      StoredPassword = Ab$4
      INPUT UserPassword
      IF UserPassword = StoredPassword THEN
            OUTPUT "Access Granted!"
      ELSE
            OUTPUT "Access Denied!"
      END IF
END
```

රූපය 17:

viii) a) කිසියම් පොදු අරමුණක් සාක්ෂාත් කරගැනීමට නිරන්තර අන්තර් ක්‍රියාකාරීත්වයෙන් යුතුව කටයුතු කරන සංඝටක සමූහයක එකතුවක් ලෙස ..... හැඳින්විය හැකි ය. මෙම හිස්තැනට සුදුසු පදය ලියන්න.

b) පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක වීමෙන් පසුව, එය වෙනස් වන පරිසරයට සහ නව අවශ්‍යතාවලට ගැළපෙන පරිදි, එහි ජීවන කාලය දීර්ඝ කිරීම සහ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා නිරතුරුවම සිදු කළ යුතු, SDLC හි අදියර කුමක් ද?

ix) a) පහත දැක්වෙන IP ලිපින (IPv4) අතුරින් **දෝෂ සහිත** (Invalid) IP ලිපින තිබෙනම් එම ලේබල ඉදිරියෙන් invalid ලෙස ද වලංගු IP ලිපින ලේබතය ඉදිරියෙන් valid ලෙස ද ලියන්න.

A. 192.168.1.100
B. 10.5.300.25
C. 172.16.2.3.4
D. 256.0.0.1

b) විද්‍යුත් තැපැල් පණිවිඩයක් යැවීමේදී, ලිපින ලබන්නන් කිහිප දෙනෙකුට එකවර යවන අවස්ථාවක, ප්‍රධාන ලබන්නන්ගෙන් එම පණිවිඩය ලැබුණු **වෙනත් ලබන්නන් සැඟවීමට** භාවිතා කරන ආමන්ත්‍රණ ක්ෂේත්‍රය (Addressing Field) කුමක්දැයි පහත ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

ලැයිස්තුව : {TO, CC, BCC, SUBJECT, ATTACHMENT}

x) a) දත්ත උපස්ථකිරීම (data backup) යනු කුමක්ද?

b) ධාරක වැඩසටහනකින් තොරව තනිව ව්‍යාප්තවීමේ හා තනිව ක්‍රියාත්මක වීමේ හැකියාව ඇති අනිෂ්ට මෘදුකාංග වර්ගය පහත අනිෂ්ට මෘදුකාංග දෙකෙන් කුමක්ද?
1. පරිගණක වෛරස 2. පරිගණක වර්ම්ස්

2. මෙහි දැක්වෙන්නේ කුඩා බේකරියක් වන "Sweet Treats" හි මාසික විකුණුම් සහ වියදම් වාර්තාවයි.

	A	B	C	D	E
1	අයිතමය (Item)	ඒකකයක මිල (Sales Price per unit)	විකුණූ ඒකක ගණන (Units Sold)	මුළු විකුණුම් (Total Sales)	ඒකකයක වියදම (Cost Per Unit)
2	පාන් (Bread)	150	450	67,500.00	80
3	කේක් (Cake)	800	120	96,000.00	350
4	කුකීස් (Cookies)	50	600	30,000.00	20
5	එකතුව (Total)		**මුළු ආදායම**	**193,500.00**	
6					
7	මාසික වියදම් (Monthly Expenses)	මුදල (Amount)			
8	කුලිය (Rent)	25,000.00			
9	උපයෝගිතා (Utilities)	5,500.00			
10	**මුළු වියදම් (Total Expenses)**	**30,500.00**		ශුද්ධ ලාභය	
11					
12	බදු අනුපාතය (Tax Rate)	4.50%			
13	**අයිතමය (Item)**	**මුළු විකුණුම් (Total Sales)**	**බදු මුදල (Tax Amount)**		
14	පාන් (Bread)	67,500.00			
15	කේක් (Cake)	96,000.00			
16	කුකීස් (Cookies)	30,000.00			
17					

වගුව 07:

i. a) මුළු විකුණුම් D2 කෝෂයට ලබාගැනීම සඳහා අවශ්‍ය සූත්‍රය ලියන්න.
b) මුළු ආදායම D5 කෝෂයට ලබාගැනීමට අවශ්‍ය සූත්‍රය ලියන්න.

ii. මුළු වියදම B10 කෝෂයට ලබාගැනීම සඳහා අවශ්‍ය සූත්‍රය ***ශ්‍රීත භාවිත නොකර*** ලියන්න.

iii. ශුද්ධ ලාභය යනු මුළු ආදයමෙන් මුළු වියදම අඩුකළ විට ලැබෙන අගය යැයි සළකා ශුද්ධ ලාබය E10 කෝෂයට ලබාගැනීමට අවශ්‍ය සූත්‍රය ලියන්න.

iv. එක් එක් භාණ්ඩ වල මුළු විකුණුම් ප්‍රමාණය මත 4.50% ක බද්දක් අයවේ නම්, බදු මුදල C15 කෝෂයට බලාගැනීමට අවශ්‍ය සූත්‍රය ලියන්න. (***කෝෂ යොමු පමණක් භාවිතත කරන්න. මෙම සූත්‍රය එම තීරුව දිගේ පහළට C16 දක්වා පිටපත් කර ඒවායේ පිළිතුරු ද ලබාගැනීමට හැකි විය යුතු ය***)

v. පහත දැක්වෙන ලැයිස්තුවෙන් මුදල් (Currency) ප්‍රරූපය හැඩසවිගැන්වීමට (formatting) සම්බන්ධ ඒවා පමණක් තෝරා ලියන්න.

ලැයිස්තුව: *1 - Date, 2 - Decimal Places, 3 - Number, 4 - Percentage, 5 - Thousands separator, 6 – Time*

vi. පහත එක් එක් දත්ත කාණ්ඩය සඳහා තීරු (column) සහ වට (pie) ප්‍රස්ථාර අතරින් වඩාත් සුදුසු කුමක්ද?
a) විවිධ අයිතම (පාන්, කේක්, කුකීස්) වලින් ලැබුණු මුළු විකුණුම් එකිනෙකට සැසඳීම.
b) මුළු මුළු වියදම් වලින් කුලිය සහ උපයෝගිතා කොපමණ ප්‍රතිශතයක් ද යන්න දැක්වීම.

vii. C17 කෝෂයෙහි =500+400*2−100/5 යන සූත්‍රය ඇතුළත් කළහොත් ලැබෙන අවසන් අගය කුමක්ද? (ගණිතමය මෙහෙයුම්වල ප්‍රමුඛතාව (operator precedence) සැලකිල්ලට ගන්න)

3. පහත දැක්වෙන්නේ පොත් බැහැර දීමේ ක්‍රියාවලිය කළමනාකරණය සඳහා භාවිත වන වගු තුනකි.

BOOK (පොත)			
B_id	B_title	B_author	B_category
B001	ගම්පෙරළිය	මාර්ටින් වික්‍රමසිංහ	නවකතා
B002	හීන හතක් මැද	කරුණාසේන ජයලත්	නවකතා
B003	අමරදාස	සයිමන් නවගත්තේගම	කෙටිකතා
B004	මකරා	ටෙනිසන් පෙරේරා	විද්‍යා ප්‍රබන්ධ
B005	මායා දර්ශන	ගුණදාස අමරසේකර	කවි

වගුව 08:

MEMBER (සාමාජික)		
M_id	M_name	M_contact
M101	සමන්	771234567
M102	නදීකා	719876543
M103	නිශාන්ත	765432109
M104	චමිලා	777777777

වගුව 09:

ISSUE (පොත් බැහැර දීම)			
I_id	B_id	M_id	Issue_date
I001	B002	M101	2025/11/01
I002	B005	M103	2025/11/03
I003	B002	M104	2025/11/05
I004	B001	M102	2025/11/07
I005	B003	M101	2025/11/08

වගුව 10:

i. නව සාමාජිකයෙකු වන **අජිත්** (M_id: M105, M_contact: 0701112223) 2025/12/02 දින පුස්තකාලයට පැමිණ, පුස්තකාලයට අලුතින් ලැබුණු **විරාගය** (B_id: B006, B_author: **මාර්ටින් වික්‍රමසිංහ**, B_category: **නවකතා**) නම් පොත බැහැර දෙන ලෙස ඉල්ලා සිටී. බැහැර දීමේ අංකය (I_id) ලෙස I006 භාවිත කරන්න.

a) **මෙම සිදුවීම වාර්තා කිරීම සඳහා දත්ත සමුදායේ යාවත්කාලීන කළ යුතු වගු මොනවාද?**
b) **එම යාවත්කාලීන කළ යුතු වගු සඳහා අදාළව ඇතුළත් කළ යුතු නව දත්ත (Records) පහත ආකෘතියට අනුව ලියන්න.**

වගුවේ නම ⟶ (ක්ෂේත්‍ර 1 අන්තර්ගතය, ක්ෂේත්‍ර 2 අන්තර්ගතය .....)
Eg. MEMBER⟶ (M1001, Saman ……)

ii. **'අමරදාස'** නම් පොත (B_title) මේ මොහොතේ බැහැර ගෙන ගොස් ඇත්තේ කුමන සාමාජිකයා විසින්ද (M_name) යන්න සොයා ගැනීමට අවශ්‍යය.**මෙම තොරතුර ලබා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම සම්බන්ධ (Join) කළ යුතු වගු මොනවාද?**

iii. පුස්තකාල පරිපාලකවරයාට පහත දැක්වෙන නව තොරතුරු දත්ත සමුදායට එක් කිරීමට අවශ්‍ය වී ඇත.

1. **නව ක්ෂේත්‍රය** (Field): Book_Published_Year (පොත මුද්‍රණය කළ වසර)
2. **නව ක්ෂේත්‍රය** (Field): Due_Return_Date (පොත ආපසු භාර දිය යුතු දිනය)

ඉහත එක් එක් නව ක්ෂේත්‍රය ඇතුළත් කිරීමට වඩාත් සුදුසුම වගුව කුමක්ද?

iv. පුස්තකාලයට පොත් සපයන **ප්‍රකාශකයන්ගේ** (Publishers) **තොරතුරු** (ප්‍රකාශකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය) දත්ත සමුදායට එක් කිරීමට අවශ්‍ය වී ඇත. දැනට සිටින කතුවරුන් කිහිප දෙනෙක් එකම ප්‍රකාශකයෙකු යටතේ පොත් මුද්‍රණය කරන බැවින්, BOOK වගුවේ සෑම පොතකටම ප්‍රකාශකයාගේ විස්තර ඇතුළු කළහොත් දත්ත පුනරාවර්තනය (Data Duplication) වීමේ අවදානමක් පවතී. එම නිසා අළුත් වගුවකට අදාල තොරතුරු ඇතුළත් කිරීමට තීරණය කළේ නම්,

a) ඇතුළත් කළ යුතු නව වගුවේ ක්ෂේත්‍ර නාම ලියන්න.
b) නව වගුව සමග සම්බන්ධතා ඇති කිරීමට දැනට පවතින BOOK වගුවට කළ යුතු වෙනස්කම් මොනවාද?


4. i. පහත a සහ b ප්‍රශ්නවලට පිළිතුර ලබාදීමට මෙම ව්‍යාජ කේතය භාවිත කරන්න.

```
N := 10;
WHILE (N MOD 3 <> 0) DO  // N 3 න් බෙදූ විට ශේෂය 0 ට සමාන නොවේ නම්
BEGIN
  N := N - 5;
  OUTPUT N;
END;
```

රූපය 18:

a) ඉහත දැක්වෙන Pseudo Code කොටසේ නිවැරදි **ප්‍රතිදානය** (Output) කුමක්ද?
b) ඉහත කේතයේ ආරම්භක විචල්‍යයේ සහ ලූප් කොන්දේසියේ පහත වෙනස්කම් දෙකඅ සිදු කළහොත්, නව ප්‍රතිදානය කුමක් වේවිද?
වෙනස්කම්:
- N හි ආරම්භක අගය 10 වෙනුවට 13 ලෙස වෙනස් කිරීම.
- කොන්දේසිය (N (mod3) ≠ 0) වෙනුවට (N (mod2) = 0) (N යනු ඉරට්ටේ සංඛ්‍යාවක් නම්) ලෙස වෙනස් කිරීම.

ii. රූපයේ දැක්වෙන ගැලීම් සටහන නිර්මාණය කර ඇත්තේ පරිශීලකයා විසින් ආදානය කරන ධන නිඛිලයක (n) සියලුම සාධක (Factors) සොයා ගැනීමට සහ ප්‍රතිදානය කිරීමටය. මෙහිදී 1 සිට n දක්වා වූ සෑම සංඛ්‍යාවක්ම (i); n හි සාධකයක් දැයි පරීක්ෂා කරනු ලැබේ. එහි A,B,C සහ D ලේබල සඳහා වඩාත්ම සුදුසු ආදේශක ලියා දක්වන්න.



රූපය 19:

iii ඉහත ගැලීම් සටහනට n=12 ලෙස අගය පැවරුවහොත් ක්‍රියාතමක වන ආකාරය දැක්වෙන වගුවක් පහත දැක්වේ. ඒ අනුව 12 ආදේශ වුවහොත් ලැබෙන ප්‍රතිදානය අසම්පූර්ණව දක්වා ඇත එහි හිස්තුන්වලට සුදුසු අගයන් ලියන්න.

පියවර	i හි අගය	i≤12	12/i ශේෂය =0	i මුද්‍රණය
ආරම්භය	1	ඔව්	12/1 ශේෂය 0 (ඔව්)	1
ඊළඟ චක්‍රය	2	ඔව්	12/2 ශේෂය 0 (ඔව්)	.....
ඊළඟ චක්‍රය	3	ඔව්	12/3 ශේෂය 0 (ඔව්)	3
ඊළඟ චක්‍රය	4	ඔව්	12/4 ශේෂය 0 (ඔව්)	.....
ඊළඟ චක්‍රය	5	ඔව්	12/5 ශේෂය 2 (නැත)	-
ඊළඟ චක්‍රය	6	ඔව්	12/6 ශේෂය 0 (ඔව්)	.....
ඊළඟ චක්‍රය	7-11	ඔව්	ශේෂය 0 නොවේ (නැත)	-
ඊළඟ චක්‍රය	12	ඔව්	12/12 ශේෂය 0 (ඔව්)	.....
අවසන්	13	නැත	-	-

වගුව 11:

5 i) ලබා දී ඇති ලැයිස්තුවේ ඇති නිවැරදි පදයන් සමඟ A සිට J දක්වා ලේබල් කර ඇති විස්තරය ගළපන්න, ඉන්පසු ලේබලය → පදය යන ආකෘතිය භාවිතයෙන් එක් එක් ලේබලයට අදාළ පදය ලියන්න

ලේබලය විස්තරය

A ඉහළ වසම් නාමයකි (top level domain).
B අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම් ලබාදෙන වෙළඳ ආයතයක් හඳුන්වන නාමයකි.
C අන්තර්ජාලයට සම්බන්ධ ඕනෑම උපංගයක් අනන්‍යව හඳුනාගන්නේ මෙය මගිනි.
D අන්තර්ජාලය තුළ ක්‍රියාත්මක වන නියාමවලියකි (protocol).
E සේවාලාභී පරිගණකවල ඇති තොරතුරු සේවාදායක පරිගණක වෙත යොමු කිරීම හඳුන්වන්නේ,
F වෙබ් අඩවි ලිපින නොදන්නා අවස්ථාවක කිසියම් කරුණක් පිළිබඳ ගූවේශනයට වෙබ් අඩවි වලට පිවිස සෙවුම් කිරීමට මෙවා භාවිත කළ හැකි ය.
G exams@doenets.lk යන විද්‍යුත් ලිපිනයේ “exams” යන කොටස හඳුන්වන්නේ,
H විද්‍යුත් තැපැල් මෘදුකාංග වල මකාදමන ලද ලිපි යම්කාලයක් රඳවා තබා ගන්නේ,
I “යටිතල පහසුකම් සේවාවක්” ලෙස” යන වලාකුළු පරිගණක සේවාව හඳුන්වන කෙටි නාමය වන්නේ,
J වේබ් අතරික්ෂුවකි (web browser).

ලැයිස්තුව : {.in, Microsoft edge, upload, ISP, IaaS, search engine, ICMP, IP address, user name, deleted}

ii) පහත දක්වා ඇති HTML කේත කොටසින් දිස් කෙරෙන වගුව ඇඳ දක්වන්න.

```
<table border="1">
  <tr>
    <th> Time </th> <th> Monday </th> <th> Tuesday </th> </tr>
    <tr><td> 08:00 </td><td colspan="2"> Mathematics </td></tr>
     <tr> <td> 09:00 </td> <td> ICT </td>  <td> Science </td> </tr>
  </table>
```

රූපය 20:

iii. රූප සටහන 1 හි පෙන්වා ඇති වෙබ් පිටුවේ html මූලාශ්‍ර කේත කොටස 1 සිට 10 දක්වා ලේබල් කර ඇති ඇතැම් හිස්තැන් සමඟ රූප සටහන 2 හි දක්වා ඇත.



රූප සටහන 1

```
<html>
 <…❶…..> <…❷…> ICT Society</title> <…❸….>
<…❹…>
<h1> ICT Society - Central College <h1>
<p> Welcome to our official <…❺…> ICT society
web page. We aim to <…❺…> enhance digital
<…❺…>
literacy among students through <…❺…> various
workshops and seminars. </p>
<h2>Main Activities of the Society</h2>
<…❻…>
   <li> Coding Workshops </li>
      <li> Learning Python and HTML</li>
   <li>Robotics Club  <li> Designing smart sensors
</li>  <li> Graphic Designing </li>

      <li>  Using Photoshop and Canva</li>
<…❼…>
<…❺…>
For more details: < …❽… href
="mailto:ict@school.lk"> Contact Us <…❾…>
<…❿…>  </html>
```

රූප සටහන 2

රූපය 21:

රූපය 2 හි 1 සිට 10 තෙක් ඇති ලේබල සඳහා නිවැරදි උසුනල පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා, එක් එක් ලේබල අංකය සහ අදාල උසුලනය ලියා දක්වන්න.

ලැයිස්තුව : <ul>, <a>, ,
 , <head>, </head>, <body> ,</body> ,<title>, </title> ,

06 i) ABC බැංකුව සිය ගනුදෙනුකරුවන් සඳහා වඩාත් නවීන පහසුකම් සහිත නව ATM පද්ධතියක් හඳුන්වා දීමට තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතියේ විවිධ අවධීන් සම්බන්ධයෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

a) මෙම නව ATM පද්ධතිය සැලසුම් කිරීමට පෙර, ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ බැංකුවේ දැනට පවතින ගැටළු හඳුනා ගැනීමට විශ්ලේෂකයන් භාවිතා කරන තොරතුරු රැස් කිරීමේ ක්‍රම 2 ක් නම් කරන්න.

b) ATM පද්ධතියේ මෘදුකාංගය නිම කළ පසු, එහි එක් එක් කොටස් (උදා: මුදල් ලබා ගැනීම, ශේෂය පරීක්ෂාව) වෙන වෙනම ගෙන පරීක්ෂාවට ලක්කිරීම කුමන පරීක්ෂා ක්‍රමය ද?

c) බැංකුව විසින් දැනට පවතින පැරණි ATM පද්ධතිය සම්පූර්ණයෙන්ම නවතා එදිනම නව පද්ධතිය ආරම්භ කරන්නේ නම්, එය හඳුන්වන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය කුමක්ද?

d) සම්පූර්ණ පද්ධතියම එකවර ක්‍රියාත්මක නොකර, පර්යේෂණාත්මක මට්ටමින් බැංකුවේ එක් ශාඛාවක පමණක් පළමුව මෙය ස්ථාපනය කරන්නේ නම් එය කුමන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය ද?

e) නව ATM පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් මාස කිහිපයකට පසු, එහි ආරක්ෂක මෘදුකාංග (Security layers) යාවත්කාලීන කිරීම පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කුමන අවධියක් යටතේ සිදු වේද?

ii) සමුදිත තොරතුරු තාක්ෂණය විෂය සඳහා "නවීන ලෝකය සහ තාක්ෂණය" යන මැයෙන් ව්‍යාපෘති වාර්තාවක් සකස් කරයි. මෙම ක්‍රියාවලියේදී ඔහුට මුහුණ දීමට සිදුවන විවිධ අවස්ථා ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


a) සමුදිත සිය වාර්තාව සඳහා අන්තර්ජාලයෙන් ලබාගත් ලිපියක්, එහි මුල් කතුවරයා ගැන සඳහන් නොකර තමාගේම නිර්මාණයක් ලෙස ඉදිරිපත් කළහොත් එම සදාචාර විරෝධී ක්‍රියාව හඳුන්වන්නේ කුමන නමකින්ද?

b) සමුදිත නව නිපැයුමක් සිදුකර එය වෙනත් අයෙකු විසින් සොරකම් කිරීම වැළැක්වීම සඳහා කිසියම් කාලයක් වෙනුවෙන් රජයෙන් ලබාගත හැකි බුද්ධිමය දේපල බලපත්‍රය කුමක්ද?

c) සමුදිත පදිංචි නගරයේ සිසුන්ට වේගවත් අන්තර්ජාල පහසුකම් තිබුණද, ඇත දුෂ්කර ගමක වසන ඔහුගේ මිතුරාට එම පහසුකම් නොමැති වීම නිසා ඇති වී තිබෙන තාක්ෂණික පරතරය හඳුන්වන නම ලියන්න.

d) සමුදිත දිගු වේලාවක් වැරදි ඉරියව්වක සිටීමින් පරිගණකය භාවිතා කිරීම නිසා ඇති විය හැකි රෝගී තත්වයන් **දෙකක්** සඳහන් කරන්න.


07 i) a) පහත වම්පස දැක්වෙන රූප තෝරාගැනීම සඳහා වඩාත් සුදුසු වන තේරීම් මෙවලම දකුණු පසින් තෝරා අංකය ඉදිරියෙන් ලේබලය එන පරිදි ලියන්න.



රූපය 22:

b) කඩාදාසි වල මුද්‍රණ කටයුතුවලදී බහුලව භාවිත වන වර්ණ ආද්ශකය (Color Model) කුමක් ද, RGB හෝ CMYK?

ii) වදන් සැකසුම් මෘදුකාංගයක අංක දමන ලද අතුරු මුහුණතක රූපයක් පහත දැක්වේ.



රූපය 23:

ඉහත අතුරු මුහුණතෙහි ඇති අක්ෂර (A-P) භාවිත කර පහතින් දක්වා ඇති එක් එක් කාර්යය සඳහා ගැළපෙන අයිකන ලේබලය ලියන්න.

1. පිටපත් කරගත් (Copy/Cut) දත්ත අවශ්‍ය ස්ථානයේ තැන්පත් කිරීම.
2. කරුණු ලැයිස්තුවක් දැක්වීමේදී පේළි ඉදිරියට අංකිතනොවන විශේෂ සලකුණු යෙදීම.
3. අකුරු වලට පහළින් කුඩා අකුරු හෝ ඉලක්කම් යෙදීම (උදා: H_2O).
4. තෝරාගත් අකුරු හෝ වචන තද පැහැයෙන් පෙන්වීම.
5. තෝරාගත් අකුරු ඇල අකුරු ලෙස පෙන්වීම.
6. තෝරාගත් අකුරු හෝ වචන යටින් ඉරක් ඇඳීම.
7. ලේඛනයේ අකුරු වම් පසට පෙළගැස්වීම.
8. අකුරු වලට විවිධ වර්ණවත් සහ ආකර්ෂණීය මෝස්තර එකතු කිරීම.
9. අකුරු වල හැඩය (Style) වෙනස් කිරීම.
10. තෝරාගත් අකුරු වල ප්‍රමාණය (Size) පියවරෙන් පියවර විශාල කිරීම.
11. ඉංග්‍රීසි අකුරු Capital හෝ Small ලෙස හෝ වෙනත් ස්වරූපයන්ට පහසුවෙන් වෙනස් කිරීම.
12. තෝරාගත් දත්ත අකාරාදී පිළිවෙළට පෙළගැස්වීම.

iii) තරුල් ඉංග්‍රීසි භාෂාවෙන් ලිපියක් සකස් කරගෙන යන විට, සමහර වචන යටින් රතු පැහැති ඇද ඉරක් (Red wavy line) දිස් විය.

(අ) තරුල්ගේ ලේඛනයේ මෙවැනි සලකුණක් දිස්වීමට හේතුව කුමක් විය හැකිද?

(ආ) මෙය නිවැරදි කරගැනීමට ඔහු භාවිතා කළ යුතු වදන්සැකසුම් මෘදුකාංග මෙවලම (Tool) නම් කරන්න.

*****

සියළු ම හිමිකම් ඇවිරිණි

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2025(2026)

පෙරහුරු විභාගය

General Certificate of Education (Ord. Level) – 2025 (2026) Practice Test

80 - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ලකුණු දීමේ පටිපාටි ය



ඔබේ පාසලේ තොරතුරු තාක්ෂණ අංශය මගින් අවසන් සංශෝධන ඇතුළත් කර අවශ්‍ය වෙනස්කම් සිදුකර ගන්න

1 පත්‍රය පිළිතුරු:

1 பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல	පිළිතුරු අංකය விடை இல	ප්‍රශ්න අංකය வினா இல	පිළිතුරු අංකය விடை இல	ප්‍රශ්න අංකය வினா இல	පිළිතුරු අංකය விடை இல	ප්‍රශ්න අංකය வினா இல	පිළිතුරු අංකය விடை இல
1.	4	11.	4	21.	1	31.	3
2.	3	12.	3	22.	2	32.	3
3.	3	13.	4	23.	1	33.	3
4.	4	14.	2	24.	2	34.	3
5.	2	15.	4	25.	2	35.	4
6.	2	16.	3	26.	2	36.	3
7.	1	17.	1	27.	1	37.	1
8.	2	18.	2	28.	1	38.	4
9.	1	19.	3	29.	3	39.	2
10.	2	20.	2	30.	3	40.	3

විශේෂ උපදෙස්
சிறப்பு வழிமுறைகள்

එක් පිළිතුරකට ලකුණු
ஒரு பதிலுக்கான புள்ளிகள்


1


බැගින්
புள்ளி வீதம்

මුළු ලකුණු மொத்த மதிப்பெண்

$1 \times 40 = 40$

ප්‍රශ්නය	පිළිතුර	ලකුණු
1 - i	පහත බුලට් අයිතම වලින් ඕනෑම දෙකක්, එකකට ලකුණු 1 බැගින්: **<u>අවස්ථාව 1: 10 ශ්‍රේණියේ ගණිත පරීක්ෂණ ලකුණු</u>** – පන්තියේ වැඩිම ලකුණ: සිසුන් පස්දෙනා අතරින් වැඩිම ලකුණ 92 වේ. – පන්තියේ සාමාන්‍ය ලකුණ: ලබාගත් ලකුණු සියල්ලේ එකතුව 5 න් බෙදීමෙන් සාමාන්‍ය ලකුණ (70) ලබාගත හැක. – අඩුම ලකුණ ලබාගත් ශිෂ්‍යයා: මෙහි අවම ලකුණ 40 වේ. **<u>අවස්ථාව 2: සතිපතා බිත්තර නිෂ්පාදනය</u>** – සතියේ මුළු බිත්තර නිෂ්පාදනය: දින 7 තුළ එකතු කළ මුළු බිත්තර ගණන (300) ලබාගත හැක. – දිනක සාමාන්‍ය බිත්තර නිෂ්පාදනය: මුළු බිත්තර ගණන 7 න් බෙදීමෙන් දිනකට ලැබෙන සාමාන්‍ය අස්වැන්න ගණනය කළ හැක. – වැඩිම බිත්තර නිෂ්පාදනයක් ලැබුණු දිනය: දත්තයන්ට අනුව බිත්තර 45 බැගින් ලැබුණු දින දෙකක් පවතින බව හඳුනාගත හැක. * වෙනත් සුදුසු යැයි හැඟෙන පිළිතුරු ද නිවැරදි ලෙස ගන්න.	2
1 – ii	1. HDMI 2.VGA 3.USB 4.Audio	2
1 – iii a)	1011 →8+0+2+1=11 11- **B** 0110 →0+4+2+0=6 6 -**6** 0001 →0+0+0+1=1 1 -**1** 1110 →8+4+2+0=14 14- **E** $B61E_{16}$	1
1 – iii b)	139 ÷ 8 = 17 කි, ඉතිරිය 3 කි. 17 ÷ 8 = 2 කි, ඉතිරිය 1 කි. **213_8** 2 ÷ 8 = 0 කි, ඉතිරිය 2 කි. සටහන්: 1. පාදය ලිවීම අත්‍යවශ්‍ය නොවේ. 2. වෙනත් පාද ලියා ඇති විට ලකුණු 0 යි.	1

1 – iv a)	 සටහන්... 1. AND කර්මය OR කර්මය ට පෙර සිදුවිය යුතු බව දැන සිටීම (තාර්කික කාරකවල ප්‍රමුඛතාවය) මැණෙන බැවින් ඒ පිළිබඳව සැළකිලිමත් වන්න)	1
1 – iv b)	<table><tr><td>x</td><td>y</td><td>x.x</td><td>y.y</td><td>x.y</td><td>(xy) . (yy)</td><td>(xx) + (xy) . (yy)</td></tr><tr><td>0</td><td>0</td><td>…0…</td><td>…0…</td><td>…0…</td><td>……0……</td><td>……0……</td></tr><tr><td>0</td><td>1</td><td>…0…</td><td>…1…</td><td>…0…</td><td>……0……</td><td>……0……</td></tr><tr><td>1</td><td>0</td><td>…1…</td><td>…0…</td><td>…0…</td><td>……0……</td><td>……1……</td></tr><tr><td>1</td><td>1</td><td>…1…</td><td>…1…</td><td>…1…</td><td>……1……</td><td>……1……</td></tr></table>	1
1 – v a)	P – User Q – Application R – OS S- Hardware	1
1 – v b)	DOS	1
1 – vi a)	Blank Slide/ title and content	1
1 – vi b)	Object 1	1

1 – vii	 ලකුණු පිරිනමන ආකරය A. 1,2,3 0.5 B. 4,5, 0.5 C. 6,7 0.5 D. ගැලීම් arrows නිවැරදි සංකේත 0.5 සටහන්: 1. පහත පර්යාය පද භාර ගැනේ Begin -> start Read -> get, Input Print -> Output, Display, Show, Write, Writeln 2. තනි උඩු කොමා (single quotes) භාරගැනේ 3. අක්ෂරභේදය (capital/simple) නොසළකන්න 4. මූල පද ඉංග්‍රීසියෙන් තිබිය යුතු ය 5. තන්තු (strings) සිංහල හෝ ද්‍රවිඩ විය හැකි ය. තන්තු අන්ර්ගතවල සුළු අක්ෂර වින්‍යාස දෝෂ නොසලකන්න.	2

1 – viii a)	පද්ධතිය	1
1 – viii b)	පද්ධති නඩත්තුව	1
1 – ix a)	A. 192.168.1.100 ⟶ Valid B. 10.5.300.25 ⟶ Invalid C. 172.16.2.3.4 ⟶ Invalid D. 256.0.0.1 ⟶ Invalid	1
1 – ix b)	BCC	1
1 – x a)	**දත්ත උපස්ථ කිරීම (Data Backup)** යනු පරිගණකයක හෝ වෙනත් උපාංගයක ඇති දත්ත හානිවීමකදී, මැකී යාමකදී හෝ සොරකම් කිරීමකදී නැවත ලබාගැනීම සඳහා ඒවායේ පිටපතක් වෙනත් ස්ථානයක සුරැකිව තබා ගැනීමයි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ දත්ත සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ හදිසි දත්ත අහිමිවීමකදී ව්‍යාපාරික හෝ පෞද්ගලික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමයි	1
1 – x b)	පරිගණක වර්ම්ස්	1

ප්‍රශ්නය	පිළිතුර	ලකුණු
2 – i - a	පහත ඒවායින් එකක් =B2*C2 = C2* B2 =(B2*C2) සටහන්: 1. කැපිටල්/ සිම්පල් අක්ෂර භේදය නොසළකන්න. 2. කෝෂ ලිපින සාපේක්ෂ විය යුතු ය (එනම් $ සංකේතය භාවිත නොකළ යුතු ය).	1
2 - i - b	පහත ඒවායින් එකක් =D2+D3+D4 =(D2+D3+D4) =SUM(D2:D4) =SUM(D2, D3, D4) සටහන්: 1. කැපිටල්/ සිම්පල් අක්ෂර භේදය නොසළකන්න. 2. කෝෂ ලිපින සාපේක්ෂ විය යුතු ය (එනම් $ සංකේතය භාවිත නොකළ යුතු ය).	1
2 - ii	පහත ඒවායින් එකක් =B8+B9 =(B8+B9) සටහන්: 1. =SUM(B8:B9) - මෙය වැරදි පිළිතුරක් ලෙස ගන්න =SUM(B8,B9) - මෙය වැරදි පිළිතුරක් ලෙස ගන්න 2. කැපිටල්/ සිම්පල් අක්ෂර භේදය නොසළකන්න. 3. කෝෂ ලිපින සාපේක්ෂ විය යුතු ය (එනම් $ සංකේතය භාවිත නොකළ යුතු ය).	2
2 - iii	= D5-B10	1
2 - v	Decimal Places, Thousands separator	1
2 - vi	a) තීරු ප්‍රස්තාර / column chart b) වට ප්‍රස්ථාර/ pie chart	2
2 - vii	1280	2

ප්‍රශ්නය	පිළිතුර	ලකුණු
3 - i	a) MEMBER , BOOK, ISSUE / වගු 3 ම/ වගු සියල්ලම/ සාමාජික, පොත, පොත් බැහැර දීම b) MEMBER -> (M105, අජිත්, 0701112223) BOOK -> (B006, විරාගය, මාර්ටින් වික්‍රමසිංහ,නවකතා) ISSUE -> (I006, B006, M105,2025/12/02) සටහන්: 1. නිවැරදි අක්ෂර වින්‍යාසය අවශ්‍ය වේ 2. අමතර වගු රෙකෝඩ ලියා ඇත්නම් ලකුණු 0 යි 3. කැපිටට් සිම්පල් අක්ෂර දෝෂ සහ ඉඩ දෝෂ නොසළකන්න. 4. ඊතලය -> අත්‍යාවශ්‍ය නැත. නිවැරදි යාවත්කාලීනයන් තුනම වගු ආකාරයට ලිවීම හෝ වරහන් තුළ ක්ෂේත්‍ර නාම ලිවීම හෝ සිංහල හෝ දෙමළ බසින් දී ඇති වගුනාම පමණක් ලියා ඇති විට (වරහන් නොමැතිව) ලකුණු 1 කි.	1 3
3 - ii	වගු තුනම/ වගු සියල්ලම	1
3 - iii	නව ක්ෂේත්‍රය (Field): Book_Published_Year- BOOK (පොත) නව ක්ෂේත්‍රය (Field): Due_Return_Date - ISSUE (පොත් බැහැර දීම)	2
3 - iv	a. Pub_ID, Pub_Name, Address, Telephone b. Book වගුවේ ආගන්තුක යතුරක් ලෙස Pub_ID ඇතුල් කිරීම	1 2

<table>
<tr><th>ප්‍රශ්නය</th><th>පිළිතුර</th><th>ලකුණු</th></tr>
<tr><td>4 i a</td><td>5 0

<table>
<tr><th>Iteration</th><th>Initial Value of N</th><th>Condition: (N(mod3)<>=0)</th><th>Process: N=N−5</th><th>Output</th></tr>
<tr><td>Start</td><td>10</td><td>—</td><td>—</td><td>—</td></tr>
<tr><td>1</td><td>10</td><td>True (10(mod3)=1)</td><td>10−5=5</td><td>5</td></tr>
<tr><td>2</td><td>5</td><td>True (5(mod3)=2)</td><td>5−5=0</td><td>0</td></tr>
<tr><td>3</td><td>0</td><td>False (0(mod3)=0)</td><td>(Loop terminates)</td><td>—</td></tr>
</table></td><td>2</td></tr>
<tr><td>4 -i b</td><td>No output/ ප්‍රතිදානයක් නැත

<table>
<tr><th>Step</th><th>Current Value of N</th><th>Condition: Is (N MOD 2 = 0)?</th><th>Action (if True)</th><th>Output</th></tr>
<tr><td>Start</td><td>13</td><td>False (13(mod2)=1)</td><td>Loop does not start</td><td>No Output</td></tr>
</table></td><td>2</td></tr>
<tr><td>4 - ii</td><td>A. නැත/no

B. ඔව්/yes

C. i =i + 1

D. Output i / Display i / i ප්‍රතිදානය කරන්න.

– A: නැත (No) – {කොන්දේසිය අසත්‍ය වූ විට වැඩසටහන අවසානය කරා ගමන් කරයි.}
– B: ඔව් (Yes) – {කොන්දේසිය සත්‍ය වූ විට ලූපය තුළට පිවිසෙයි.}
– C: i - වාරක අගය (Increment) වැඩි කිරීම සඳහා: .i = i +1
– D: i ප්‍රතිදානය කරන්න (Output i) – {ශේෂය 0 නම්, එම අගය හි සාධකයක් බැවින් එය මුද්‍රණය කළ යුතුය.}</td><td>4</td></tr>
</table>

4 - iii	පියවර	i හි අගය	i≤12	12/i ශේෂය =0	i මුද්‍රණය	2
	ආරම්භය	1	ඔව්	12/1 ශේෂය 0 (ඔව්)	1	
	ඊළඟ චක්‍රය	2	ඔව්	12/2 ශේෂය 0 (ඔව්)	2.	
	ඊළඟ චක්‍රය	3	ඔව්	12/3 ශේෂය 0 (ඔව්)	3	
	ඊළඟ චක්‍රය	4	ඔව්	12/4 ශේෂය 0 (ඔව්)	4	
	ඊළඟ චක්‍රය	5	ඔව්	12/5 ශේෂය 2 (නැත)	-	
	ඊළඟ චක්‍රය	6	ඔව්	12/6 ශේෂය 0 (ඔව්)	6.	
	ඊළඟ චක්‍රය	7-11	ඔව්	ශේෂය 0 නොවේ (නැත)	-	
	ඊළඟ චක්‍රය	12	ඔව්	12/12 ශේෂය 0 (ඔව්)	12	
	අවසන්	13	නැත	-	-	

<table>
<tr><th>ප්‍රශ්නය</th><th>පිළිතුර</th><th>ලකුණු</th></tr>
<tr><td>5 - i</td><td>A. .in
B. ISP
C. IP address
D. ICMP
E. Upload
F. Search engine
G. Username
H. Deleted
I. IaaS
J. Microsoft edge

<table><tr><th>නිවැරදි පිළිතුරු ගණන</th><th>ලකුණු</th></tr><tr><td>3,4</td><td>1</td></tr><tr><td>5,6,7</td><td>2</td></tr><tr><td>8,9</td><td>3</td></tr><tr><td>10</td><td>4</td></tr></table></td><td>4</td></tr>
<tr><td>5- ii</td><td><table><tr><th>Time</th><th>Monday</th><th>Tuesday</th></tr><tr><td>08:00</td><td colspan="2">Mathematics</td></tr><tr><td>09:00</td><td>ICT</td><td>Science</td></tr></table>
ලකුණු පිරිනැමීම

A: තීරු තුනක් සහිත title පේළිය:
B: 08.00 සහ mathematics පේළි දෙකක සංයුක්ත වීම
C: තීරු 3 ක් සහිත අවසන් පේළිය
D: සම්පූර්ණ බව

– මාතෘකා කළු අකුරින් (bold)
– නිවැරදි කැපිටල් සිම්පත් අක්ෂර භාවිතිය
– වමට එකඑල්ල වූ අන්තර්ගතයන්
– අමතර පේළි තීරු නැති බව</td><td>0.5

0.5
0.5
0.5</td></tr>
<tr><td>5 - iii</td><td>1. <head>
2. <title>
3. </head>
4. <body>
5.

6.
7.
8. <a>
9.
10. </body>

<table><tr><th>නිවැරදි පිළිතුරු ගණන</th><th>ලකුණු</th></tr><tr><td>3,4</td><td>1</td></tr><tr><td>5,6,7</td><td>2</td></tr><tr><td>8,9</td><td>3</td></tr><tr><td>10</td><td>4</td></tr></table></td><td>4</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
</table>

Past Papers Wiki

ප්‍රශ්නය	පිළිතුර	ලකුණු
6 i	a) සම්මුඛ පරීක්ෂණ/ප්‍රශ්නාවලි/නිරීක්ෂණ/ලේඛන පරීක්ෂාව	1
	b) ඒකක පරීක්ෂාව	1
	c) සෘජු පිහිටුවීම/ සෘජු ක්‍රියාත්මක කිරීම/ direct deployment	1
	d) නියමු පිහිටුවීම/ නියමු ක්‍රියාත්මක කිරීම / pilot deployment	1
	e) පද්ධති නඩත්තුව/ system maintenance	1
6 ii	a) ලිඛිත දෑ සොරකම / plagiarism	1
	b) පේටන්ට් බලපත්‍රය / patent	1
	c) අංකිත බෙදුම / digital devide	1
	d) පරිගණක දෘෂ්ටි සහලක්ෂණය/ කාපල දෝනා සහලක්ෂණය,/ මාංශ පේෂි සහ අස්ථි ආශ්‍රිත වේදනා/ ආතතිය/	2

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ප්‍රශ්නය	පිළිතුර	ලකුණු
7 i	a) 1 - ඇ 2 - ආ 3 - අ b) CMYK	0.5 0.5 0.5 0.5
7 ii	1. A 2. H 3. M 4. B 5. C 6. L 7. O 8. N 9. D 10. F 11. G 12. J	6
7 iii	a) Spelling error / අක්ෂර විණ්‍යාස දෝෂ b) Spelling and Grammar Check	1 1

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank